**රුහුණ විශ්වවිද්‍යාලය - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය**
**ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය -2014 සඳහා**
**අයදුම්පත් කැඳවීම**

1. රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් 2014 පැවැත්වීමට නියමිත ඉහත සඳහන් පරීක්ෂණය සඳහා සුදුසුකම් ලත් අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. 2013 දෙසැම්බර් 31 වන දිනට ලියාපදිංචි කාලසීමාව අවසන් වී ඇති, මෙතෙක් ලියාපදිංචිය දීර්ඝ කරවා නොගත් අපේක්ෂක අපේක්ෂිකාවන් විභාගය අයදුම් කිරීමට පෙර තම ලියාපදිංචි කාල සීමාව දීර්ඝ කර ගත යුතු අතර, ඒ සඳහා නියමිත අයදුම්පත් www.dceu.ruh.ac.lk අපගේ වෙබ් අඩවිය මඟින් ලබා ගත හැකිය. ඒ අනුව ලියාපදිංචිය දීර්ඝ කර ගන්නා තෙක් එම අපේක්ෂක අපේක්ෂිකාවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු නොලැබේ. (2004, 2005,2006,2007,2008,2009,2010 වර්ෂවල ලියාපදිංචි වී ඇති සිසුන් සඳහා අදාළ වේ.) **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016.04.25 දින** බැවින්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදිනට හෝ ඊට පෙර ලැබෙන සේ " **සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම හා වර්ෂය සඳහන් කළ යුතුය.**

3. පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති අය විසින් හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ එවනු ලබන සියලුම අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ.

4. මෙම පරීක්ෂණ සඳහා ඔබ මීට පෙර පෙනී සිටියේ නම් අදාළ වර්ෂය, විභාග අංකය හා සමත් අසමත් භාවය පිළිබඳ සටහන් කළ යුතුය.

5. ඔබ මෙම පරීක්ෂණයන්ට මීට පෙර ඉල්ලුම් කර, පෙනී නොසිටියේ නම් ඊට හේතුව පැහැදිලි ව සටහන් කරන්න. තවද ඔබ විභාගයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කොට එය විශ්වවිද්‍යාලය පිළිගෙන ඇති බැව් ඔබ වෙත දැනුම් දී ඇත්නම් එම තොරතුරු පැහැදිලි ව අයදුම්පත්‍රයේ සඳහන් කරන්න.

6. පරීක්ෂණයට පෙනී සිටින විෂයයන්, පත්‍ර නාමය හා පත්‍ර සංකේතය අයදුම්පතෙහි සටහන් කරන්න.

7. පරීක්ෂණ ගාස්තු ගෙවීම.

   පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා නියමිත බැංකු වවුචර් පත් දෙකක් විභාග අයදුම්පත සමග එවා ඇත. අදාළ මුදල් එම බැංකු වවුචර් පත් මඟින් මහජන බැංකුවේ උයන්වත්ත ශාඛාවේ අංක 032-1-001-1-2477594 දරණ රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර විභාග ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා බැංකුව විසින් ආපසු දෙනු ලබන වවුචර් පත ගාස්තු ගෙවූ කුවිතාන්සිය වශයෙන් අයදුම්පතට අමුණා එවිය යුතුය. අදාළ පරීක්ෂණ සඳහා ලියාපදිංචි වන හා ලියාපදිංචිය දීර්ඝ කිරීමට අවශ්‍ය සිසුන් ද මතු සඳහන් පරිදි අදාළ මුදල් ගෙවිය යුතුය. මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් හෝ චෙක්පත් මඟින් කරනු ලබන ගෙවීම් බාර ගනු නොලැබේ.

8. අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර අදාළ පරිදි අයදුම්පතේ සඳහන් කළ යුතුය.

   **නියමිත විභාග ගාස්තු**

   **අසමත් ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටින විට**
   අසමත් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා රු. 1000

9. ඉල්ලුම් පත්‍රය සමග බැංකු කුවිතාන්සිය අමුණා එවිය යුතුය.

ඩබ්. ඩබ්. අනුර
සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය'
2016.03.28